# වන්නි යුද්ධය සහ කලාපීය දේශපාලනය - රවීස (රාවය)

නොවැම්බර් 26 වෙනිදා මුම්බායි නගරය ත්‍රස්ත කළ සැළසුම් සහගත මහා මිනිස් ඝාතනයෙන් විසි හතර පැයක් ඇවෑමෙන් දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානයේ නායක වේලුපිල්ලෙ ප්‍රභාහරන් ස්වකීය වාර්ෂික මහා විරු දින ප්‍රකාශය වන්නියේ සිට ඉදිරිපත් කළේය. මහාවිරු දින ප්‍රකාශයට යොමුවන්නට තිබූ කලාපීය අවධානය මුම්බායි මිනිස් ඝාතනය විසින් වෙනතකට හැර වූ බවක් බැලූ බැල්මට පෙනෙන්නට තිබිණ. ඒ පිළිබඳ සැළකිය යුතු ප්‍රීතියකින් කරුණු දක් වූ ඇතැම් විශ්ලේෂකයින්ට අනුව නොවැම්බර් 27 වෙනිදා කොටි සංවිධානයේ නායකයාගේ ප්‍රකාශය කිසිදු වැදගත් අවධානයක් දිනා ගනු නොලැබීය. මේ තර්කයෙන් හැඟවෙන්නේ ප්‍රකාශය විසින් දිනාගන්නා ලද අඩු අවධානයට හේතුව ප්‍රකාශයේ අන්තර්ගතය නොව, මුම්බායි ප්‍රහාරය විසින් ජනිත කළ අනපේක්ෂිත සංත්‍රාසය බවයි. කොටි නායකයාගේ ප්‍රකාශයෙහි දේශපාලන වැදගත්භාවය තීරණය කෙරෙන්නේ එය විසින් දිනාගන්නා අවධානය මගින් යැයි මෙමගින් ගම්‍ය කෙරේ.

මේ අනුව ශ්‍රී ලංකා රජයේ යුදමය ක්‍රියාමාර්ගයට පක්ෂපාතී අදහස් දරන්නවුන්ගෙන් සැදුම්ලත් දකුණේ ජනප්‍රිය දේශපාලනයේ දෘෂ්ටි කෝණයෙන් බලතොත් මුම්බායි ප්‍රහාරය රහස් ප්‍රමෝදයකට හේතු දෙකක් සපයයි. ඒ සම්බන්ධයෙන් දකුණේ විවිධ කණ්ඩායම් සහ පක්ෂ විසින් කළ ප්‍රකාශ සහ නිවේදන පිරික්සා බැලීමෙන්ද, සිංහල සහ ඉංග්‍රීසි පුවත්පත් මෙන්ම වෙබ් අඩවිවල පළ වූ ලිපි, විශේෂාංග සහ කාටූන් විමසා බැලීමෙන්ද මේ බව ප්‍රත්‍යක්ෂ කොටගත හැක. ඒ අනුව පළමුවෙනුව මුම්බායි ප්‍රහාරය කොටි නායකයාගේ මහා විරු ප්‍රකාශයට යොමුවන්නට තිබූ අවධානය අඩු කිරීමට ඉවහල් විය. එය උපක්‍රමික වාසියකි. දෙවනුව, එය ශ්‍රී ලංකාවේ දෙමළ ජනයාගේ ප්‍රශ්නය පිළිබඳ 'ඉන්දියානු ආකල්පයේ' වෙනසක් ඇති කිරීමට බොහෝ විට හේතුවිය හැකි පසුබිමක් සකස් කළේය. එය උපායික වාසියකි.

මුම්බායි ප්‍රහාරයෙන් ලංකාව උපයාගත් 'උපක්‍රමික වාසිය' ගැන විශ්වාසය මතභේදයන්ට තුඩු නොදෙන්නේ එහි සාපේක්ෂ ඇත්තක් ගැබ්ව ඇති හෙයිනි. නමුත් 'උපායික වාසිය' පිළිබඳ විශ්වාසය දේශපාලනිකව සදොස් එකක් වනවා පමණක් නොව, යථාර්ථ විරෝධී එකක්ද වන බව දැනටමත් සනාථ වෙමින් තිබේ. එය දේශපාලනිකව සදොස් එකක් වන්නේ, ශ්‍රී ලංකා රජයේ යුදමය පිළිවෙත සම්බන්ධයෙන් ඉන්දියාව තුළ බල පවත්වන තනි සහ පොදු ඒකමතිකත්වයක් ඇතැයි එමගින් පූර්ව කල්පනය කරන නිසා ය. (ඒ වෙනුවට සිව්වෙනි ඊළම් යුද්ධය පිළිබඳ නවදිල්ලිය සහ තමිල්නාඩුව අතර තීව්‍රවන ආකල්පමය සහ ක්‍රියාමාර්ගික ධ්‍රැවීකරණයේ ස්වභාවය ගැන මෙම ලිපි පෙළෙහි මුල් කොටස් මගින් සවිස්තරාත්මකව පැහැදිලි කෙරිණ.) එය යථාර්ථ විරෝධී එකක් වන්නේ, ශ්‍රී ලංකාවේ යුද්ධය සම්බන්ධයෙන් වන දකුණු ඉන්දීය ක්‍රියාකාරීත්වයන් මුම්බායි ප්‍රහාරයෙන් සතියක් ඇවෑමෙන් යළිත් ක්‍රමානුකූලව වර්ධනය වනු දැකිය හැකි නිසා ය.

### නොනවතින තමිල්නාඩු විරෝධය

දෙසැම්බර් 02 වෙනිදා ඉන්දීය ලෝක් සභාව සහ රාජ්‍ය සභාව තුළ තමිල්නාඩුව නියෝජනය කරන සර්ව පාක්ෂික නියෝජිත කණ්ඩායමක් නවදිල්ලියේදී අගමැති මන්මෝහන් සිං හමු වී ශ්‍රී ලංකාවේ යුද්ධය සම්බන්ධයෙන් සක්‍රීය මැදිහත්වීමක් කරන්නැයි බලකර සිටියහ. තමිල්නාඩු

මහ ඇමති එම්.කරුණානිධි විසින් නොවැම්බරයේදී කැඳවන ලද සර්ව පාක්ෂික සමුළුවේදී ඇතිකරගත් එකඟතා ප්‍රකාරව ඉක්මන් සටන් විරාමයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයට බලකර සිටීමට නවදිල්ලි පාලනය යොමුකරවීම මෙම හමුවේ මූලික අරමුණක් බව දෙසැම්බර් 02 වෙනිදා 'චෙන්නායි ඔන්ලයින්' වෙබ් අඩවිය වාර්තා කර තිබිණ. තමිල්නාඩු ප්‍රාන්තය සහ පොඩිචෙරි නියෝජනය කරමින් පාර්ලිමේන්තු නියෝජිතයින් 35 දෙනෙකු මෙකී සර්ව පාක්ෂික නියෝජිත කණ්ඩායමට ඇතුළත් වූහ. අගමැතිවරයා සමග වූ හමුවෙන් පසුව පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාව ඇමතූ ඩීඑම්කේ පක්ෂයේ රාජ්‍ය සභා නියෝජිත කණිමෝළි කරුණානිධි, 'යුද කලාපය තුළ බල පවතින ආහාර, ඖෂධ සහ වෙනත් සහන සේවාවන්ගේ හිඟකම පිළිබඳ අගමැතිවරයාගේ අවධානය යොමුකිරීමට තමන් කටයුතු කළ බව' පැවසුවාය.ඉන්දීය රජයේ නාවුක, මහා මාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍යවරයා මෙන්ම ද්‍රවිඩ මුන්නේත්‍ර කළහම් පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම් නායක ටී.ආර්.බාලු විසින් නායකත්වය දුන් මෙකී නියෝජිත කණ්ඩායම 'බැරෑරුම් මැදිහත්වීමක්' සම්බන්ධයෙන් අගමැතිවරයාට බලකර සිටි බව දෙසම්බර් 03 වෙනි දා 'හින්දු' පුවත්පත වාර්තාකර තිබිණ. *(India will try for a political solution in Sri Lanka / The Hindu - 03.12.2008)*

මෙම ලිපිය ලියන මොහොත වන විට, මහ ඇමති කරුණානිධිගේ නායකත්වයෙන් යුතු තමිල්නාඩු ප්‍රාන්ත පාර්ලිමේන්තුවේ නියෝජිත කණ්ඩායමක් දෙසැම්බර් 04 වෙනිදා යළිත් නවදිල්ලියේදී අගමැති මන්මෝහන් සිං හමුවීමට නියමිතව තිබේ. දෙසැම්බර් 03 වෙනිදා අන්තර්ජාලයේ පළ වූ වාර්තාවකට අනුව මෙම හමුවේදීද ඉක්මන් සටන් විරාමයක් සඳහා ශ්‍රී ලංකා රජය යොමුකරවා ගැනීමට නවදිල්ලියේ මැදිහත්කරවා ගැනීමට තමිල්නාඩු නියෝජිතයෝ අපේක්ෂා කරති. *(Tamil-nadu MLAs to meet PM on Sri Lanka / www.bombaynews.net - 03.12.2008)* නමුත් මුම්බායි ප්‍රහාරය සිය අභිලාෂයන්ට වාසිදායක ලෙස හසුරුවා ගැනීමට ශ්‍රී ලංකා රජය උත්සාහ දරතැයි යන චෝදනාවෙන් කෙලින්ම දමා ගසන ලද්දේ ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය විසිනි. දෙසැම්බර් 02වෙනිදා කලාපයේ කතුවැකියෙන්ම මෙකී චෝදනාව එල්ල කරන කොමියුනිස්ට් පක්ෂයේ නිල පුවත්පත වන 'ජනශක්ති' පත්‍රය, 'මුම්බායි සංහාරය සහ එමගින් නිර්මාණය කොට ඇති පොදු මනෝභාවය සූරාකමින්, සිය අයිතීන් ඉල්ලා සිටින දෙමළ ජනයා ත්‍රස්තවාදීන් වශයෙන් හංවඩු ගසා හුදකලා කිරීමට කොළඹ ආණ්ඩුව ඉන්දියාවේ සහාය ඉල්ලා ඇති' බවට චෝදනා නගා තිබිණ.

මුම්බායි නගරයට එල්ල වූ ප්‍රහාරය සිව්වෙනි ඊළම් යුද්ධයේදී කොටින්ට එරෙහිව සිය උපායමාර්ගික අභිලාෂයන් මුදුන්පත් කරගැනීම සඳහා පහසුවෙන්ම යොදාගත හැකි වනු ඇතැයි කල්පනා කිරීම යථාර්ථ විරෝධී එකක් වන්නේ දැනටමත් දකුණු ඉන්දීය දේශපාලන ක්ෂේත්‍රය තුළ දැකිය හැකි මෙකී වර්ධනයන් හේතුවෙනි. වන්නිය මුළුමණින්ම අල්ලා ගැනීම පිණිස දිග්ගැසෙන යුදමය ක්‍රියාන්විතයන් විසින් ගැඹුරු කිරීමට ඉඩ ඇති වඩා දරුණු මානුෂීය අර්බුදයන් විසින් දකුණු ඉන්දීය විරෝධයන් ඉදිරියේදී වඩ වඩාත් මෙළවීමට ඇති අවකාශය කිසිසේත් සුළුපටු එකක් නොවේ.

**ඉන්දියානු සාධකයේ අනාගතය**

නොවැම්බර් 26 වෙනිදා මුම්බායි නරගයට එල්ල කරන ලද ප්‍රහාරය හේතුවෙන් මතු වීමට ඉඩ තිබෙන ව්‍යාකුලතා නිරාකුල කරනු වස් සිදුකළ මේ පැහැදිලි කිරීමෙන් ඔබ්බට කල්පනා කළහොත් හතරවෙනි ඊළම් යුද්ධයේ මීළඟට එළඹෙන වකවානුව තුළ ඉන්දියානු භූමිකාව කෙබඳු එකක් වනු ඇතිදැයි තක්සේරු කිරීම මුඛ්‍ය වැදගත්කමක් ගනියි.

මීට පෙරද පෙන්වා දුන් පරිදි ජනතා විමුක්ති පෙරමුණ මෙන්ම එහි තරඟකාරී ප්‍රතිවාදීන් වන ජාතික නිදහස් පෙරමුණ සහ ජාතික හෙළ උරුමය ඉන්දීය මැදිහත්වීම්වලට එරෙහිව එකිනෙකා පරයමින් දැනටමත් ශුද්ධ යුද්ධ ප්‍රකාශයට පත්කොට තිබේ. මේ වනවිට සිදු කෙරෙන ඉන්දීය මැදිහත්වීම්වලට පිටුබල දෙන රාජ්‍ය තාන්ත්‍රික පිළිවෙත, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන තනි ඒකීය උපාය මාර්ගික අභිලාෂයන් මත පදනම් වූවක් වශයෙන් මොවුහු සළකති. ඒ සඳහා ඉන්දීය දේශපාලනයේ මධ්‍යය (නවදිල්ලිය) සහ පරිධිය (තමිල්නාඩුව) අතර මේ වනවිට තීව්‍ර වී පෙනෙන ධ්‍රැවීකරණය ඕනෑකමින් නොසළකා හැරීමට මෙකී බලවේග තීන්දු කොට ඇති බව පෙනේ. නමුත් නවදිල්ලිය සහ තමිල්නාඩුව අතර වර්ධනය වන අභ්‍යන්තර විභේදනය හුදෙක් ඉන්දියානු ජාතික දේශපාලනයට ආවේණික 'සංසාරගත පරස්පරතාවන්ගේ පුපුරා යාමක්' වශයෙන් නොසැළකිය යුතු ය.

ඇත්ත වශයෙන්ම ඉන්දීය කොන්ග්‍රසය විසින් නායකත්වය සපයන පාලක එක්සත් ප්‍රගතිශීලී සන්ධාන ආණ්ඩුව විසින් හතරවෙනි ඊළම් යුද්ධය සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන රාජ්‍ය තාන්ත්‍රික පිළිවෙත, නියත ලෙස ගැටගැසී ඇත්තේ ගෝලීය බල දේශපාලනය තුළ ඉන්දියාව විසින් අනුයන පිළිවෙත සමග ය. දකුණු ඉන්දීය විරෝධතා පාලනය කළ නොහැකි සීමාවන් දක්වා වැඩී එන තුරු නවදිල්ලි පාලනය විසින් විවෘතව මෙන්ම ආවෘතවද අනුගමනය කළා වූ ශ්‍රී ලංකා රජයේ යුදමය නැඹුරුව දිරි ගන්වන සුළු භූමිකාව ඉන්දීය පාලක පන්තියේ අහඹු තෝරාගැනීමක ප්‍රතිඵලයක් නොවේ. එම පිළිවෙත නොවැළැක්විය හැකි ලෙස යාවී පවතින්නේ ඉන්දියාව කේන්ද්‍ර කොටගෙන ඉන්දීය සාගර කලාපය තුළ නිර්මාණය වෙමින් පවතින නව භූ දේශපාලනික සන්ධානයන්ගේ යථාර්ථය සමග ය.

මින් අදහස් කරන්නේ කුමක්ද?

නිරවි යුද කාලීන ඉන්දියාව විසින් අනුගමනය කළා වූ විදේශ පිළිවෙතෙහි තීරණාත්මක නිමාව සළකුණු කරමින් ඉන්දියාව සහ එක්සත් ජනපදය අතර ඇති කොටගත් මෑත කාලීන ආරක්ෂණ සහ දේශපාලන සබඳතා සමස්ත ඉන්දීය සාගර කලාපීය භූ දේශපාලන යථාර්ථයන් තීරණාත්මක විපර්යාසයකට දැන් පාත්‍ර කොට කොට තිබේ. 2004 වසරේ සිට 2008 ඔක්තෝබරය දක්වා අඛණ්ඩව පවත්වාගෙන ආ ඉන්දු-ඇමරිකානු ඒකාබද්ධ යුද අභ්‍යාස වැඩසටහන්ද, 2005දී දෙරට අතර අත්සන් තැබුණු විශේෂ ආරක්ෂණ ගිවිසුමද *(Defence Framework Agreement)* , ජාත්‍යන්තර න්‍යෂ්ටික බලශක්ති අධිකාරිය තුළ ඉරානයට එරෙහිව ඉන්දියාව විසින් සිය ඡන්දය භාවිතා කිරීමද, 2005 සිට ක්‍රමානුකූලව පරිණාමය වූ ඉන්දු-ඇමරිකානු න්‍යෂ්ටික සහයෝගීතා වැඩ පිළිවෙත්වල ඉදිරි වර්ධනයක් වශයෙන් අත්සන් තැබුණු ඓතිහාසික න්‍යෂ්ටික ගිවිසුම විසින්ද පෙන්නුම් කරන ලද්දේ එකී රැඩිකල් විපර්යාසයන්ගේ කූට ප්‍රාප්තියයි. ඉන්දියාව සහ එක්සත් ජනපදය අතර පෙර නොවූ විරූ ලෙස වර්ධනය වන සබඳතා සමස්ත ඉන්දු උප මහා ද්වීපික කලාපයෙහිම බල තුලනය තීරණාත්මක වෙනසකට භාජනය කරන ලද අතර නවදිල්ලියේ පාලක එක්සත් ප්‍රගතිශීලී සන්ධානයේ ආධාරක බලවේගයක් වශයෙන් එතෙක් ක්‍රියා කළ කොමියුනිස්ට් පක්ෂ ප්‍රමුඛ ඉන්දීය වාමාංශය, 2008 ජූලි 09 වෙනිදා ආණ්ඩුවට ලබාදුන් සහාය ඉවත්කරගැනීමට තීන්දු කිරීම මෙකී වර්ධනය වන ප්‍රවණතාවට එරෙහිව එල්ල කළ පළමු වැදගත් ප්‍රහාරය වශයෙන් සැළකිය හැකි ය.

හතරවෙනි ඊළම් යුද්ධයේදී ශ්‍රී ලංකා රජයේ යුදමය හස්තය ශක්තිමත් කිරීමට නවදිල්ලි පාලනය විසින් විවෘතව අනුගමනය කළා වූ මිලිටරි ආධාරක පිළිවෙත වටහා ගත යුත්තේ

ඉහත කී කලාපීය සන්ධානයන්ගේ සන්දර්භය තුළ ය. මෙහිදී එක් අතකින් ශ්‍රී ලංකාව අරභයා චීනය සහ පකිස්ථානය විසින් අනුගමනය කළා වූ සහයෝගී පිළිවෙත අභිබවා යාමේ අභිලාෂය නවදිල්ලිය විසින් පෙන්නුම් කරන ලදී. අනෙක් අතින් ශ්‍රී ලංකා රජයේ යුදමය ශක්‍යතා වැඩි දියුණු කිරීමට එක්සත් ජනපදය විසින් අනුගමනය කළ ක්‍රියා පිළිවෙතට අනුපූරක භූමිකාවක් කලාපීයව රඟ දක්වීමට නවදිල්ලි පාලනයේ ඇති සූදානමද එමගින් පෙන්නුම් කරන ලදී. දකුණු ඉන්දියාව කේන්ද්‍ර කොටගෙන ඉකුත් තුන් මාසයක කාලය තුළ ශ්‍රී ලංකා රජයට එරෙහිව වර්ධනය වූ විරෝධයන්ගේ ඓතිහාසික වැදගත්කම තක්සේරු කළ යුත්තේ යට කී පසුබිම තුළ ය.

**ඇමරිකානු විරෝධීන්ගේ ඊළම් සහයෝගිතාව**

වර්ධනය වන ඉන්දු - ඇමරිකානු සබඳතාවන්ට එරෙහිව ඉන්දියාව පුරා පැතිරුණු බහුජන ප්‍රතිරෝධය බලමුළු ගැන් වූ ඉන්දීය වාමාංශයම, හතරවෙනි ඊළම් යුද්ධයට එරෙහිව ඉස්මතුව ආ දකුණු ඉන්දීය විරෝධතා ව්‍යාපාරයන් තුළ ශ්‍රී ලාංකීය දෙමළ ජනයාගේ ස්ව නිර්ණ අයිතිය පිළිබඳ සටන් පාඨය පෙරට ගැනීමේදී ප්‍රමුඛ වැඩ කොටසක් ඉටු කිරීම ඇත්ත වශයෙන්ම වැදගත් දේශපාලන හැඟවුම් පළ කරයි. දෙමළ විමුක්ති කොටි සංවිධානය විසින් දැනටමත් මෙකී සන්ධානයේ ඓතිහාසික වැදගත්කම ග්‍රහණය කොටගෙන ඇති බවට ඉඟි කොට තිබේ. නොවැම්බර් 27 වෙනිදා කොටි සංවිධානයේ නායකයා විසින් කරන ලද මහා විරුදින ප්‍රකාශයෙහි අන්තර්ගතය ප්‍රවේශමින් කියවා බැලීමට අමතක නොකළ ඕනෑම අයෙකුට මේ සත්‍යතාව වැටහී යනු ඇත. එක් අතකින් 'සාම ක්‍රියාදාමය අස්ථාවර කරමින් ශ්‍රී ලංකා රජයේ යුදමය අභිලාෂයන් පෝෂණය කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන්' එක්සත් ජනපදයට වක්‍රව මුත් දීර්ඝ වශයෙන් පහර දෙන කොටි නායකයාගේ ප්‍රකාශය තුළ අනෙක් අතින් 'දකුණු ඉන්දියානු බහුජන සහයෝගිතා ව්‍යාපාරයන්ගේ ඓතිහාසික වැදගත්කම' අවධාරණය කරමින් ඒ සඳහා මුල් වූ බලවේගයන්ට කෘතවේදීතාව පිරිනමනු ලබයි. හතරවෙනි ඊළම් යුද්ධයේදී තමන්ට වාසි සහගත කලාපීය දේශපාලන සන්ධානයක් වර්ධනය කර ගැනීමකින් තොරව, ගෝලීයව පැතිරුණු යුදමය සන්ධානයක පිටුබල ලබන මිලිටරි ක්‍රියාන්විතයන්ට ප්‍රතිරෝධයක් සැළසුම් කළ නොහැකි බව කොටි සංවිධානය ඒත්තු ගෙන ඇති බවක් එයින් හැඟ වේ. ඒ සඳහා දකුණු ඉන්දීය බහුජන සහයෝගීතාවන් ලීවරයක් වශයෙන් යොදාගනිමින් නවදිල්ලියට බලපෑම් කිරීමට කොටි සංවිධානය වෑයම් කරනු පෙනෙන්නේ එකී ගෝලීය යුද සන්ධානය තුළ දැනට සක්‍රීය ඉන්දීය භූමිකාවේ ක්‍රියාකාරීත්වයට හැකිතාක් තිරිංග ලෑමේ අටියෙන් වීමට ඉඩ තිබේ.

කෙසේ වුවද හතරවෙනි ඊළම් යුද්ධය අරභයා නවදිල්ලි පාලනය දැරූ සහයෝගී ආකල්පයට පහසුවෙන් ගැළවී ගත නොහැකි විලංගුවක් දකුණු ඉන්දීය ක්‍රියාකාරීත්වයන් විසින් නිර්මාණය කරමින් ඇති බව දැන් පැහැදිලි ය. ඉන් ගැළවීමට ගන්නා සෑම පියවරක් විසින්ම ඉන්දියාවේ අභ්‍යන්තර ධ්‍රැවීකරණයන් තීව්‍ර කරනු ඇති අතර කේන්ද්‍රය සහ පරිධිය අතර වන සම්බන්ධතාවයේ අසව් දුර්වල කරනු ඇත. නවදිල්ලියේ තීරණය කුමක් වුවද ඉන් නොවැළැක්විය හැකි ලෙස වාසි සළසා ගැනීමට දැන් නිර්මාණය වී ඇති තත්ත්වය තුළ කොටි සංවිධානය හැකියාව ලැබී තිබේ. යම් හෙයකින් දකුණු ඉන්දීය බලපෑම් පිළිගෙන නවදිල්ලි පාලනය ශ්‍රී ලංකා රජය කෙරෙහි සීමිත හෝ බලපෑම් කරන්නේ නම් එහි කෙටිකාලීන උපක්‍රමික වාසිය කොටි සංවිධානය සතුවනු ඇත. නොඑසේව දකුණු ඉන්දීය බලපෑම්වලට පිටු පා තවදුරටත් ශ්‍රී ලංකා රජයේ යුදමය ක්‍රියාමාර්ගයට අනුබල සැපයීමට නවදිල්ලිය

තීරණය කරන්නේ නම්, ඒ හේතුවෙන් දකුණු ඉන්දියාව තුළ නොවැළැක්විය හැකි ලෙස වර්ධනය වීමට ඉඩ තිබෙන නවදිල්ලි විරෝධී මනෝභාවයේ දිගුකාලීන උපාය මාර්ගික වාසිය කොටි සංවිධානයට හිමිවනු ඇත.

හතරවෙනි ඊළම් යුද්ධයේ ජය සහ පරාජය තීරණය වනු ඇත්තේ හුදෙක් වන්නි සටන් බිමේ යුද සේනා හැසිරවීමේ කුශලතාව මගින් පමණක් නොවේ. එය අන් කවරදාටත් වඩා දැන් රඳා පවතින්නේ සමස්ත ඉන්දු උප මහාද්වීපික කලාපය තුළ දේශපාලන බලවේගයන් හසුරුවාගැනීමේ කුශලතාව මත ය.

**(අවසානයි)**

*raveesa@googlemail.com*